# <u>මාර්ග බලපත්‍රයක් නිකුත් කිරීම / දීර්ඝ කිරීම.</u>

I. ටෙන්ඩර් මගින් ලබාගත් මාර්ග බලපත්‍රයක් නම් ටෙන්ඩර් කොන්දේසි ප්‍රකාරව අදාල ගාස්තු ගෙවා තිබිය යුතුය.

II. මාර්ග බලපත්‍රයක් නිකුත් කිරීමේ දී සාමාන්‍ය හෝ සුඛෝපභෝගී බස්රථයක් වෙනුවෙන් මසකට රු.417/- ක් බැගින් වසරකට රු.5000/- ක් අයකරනු ලබන අතර, ලේබලය සඳහා රු. 200/- ක් ද මෝ.ප්‍ර.කො. 250/- ක් ද අයකරනු ලබයි. දීර්ඝ කිරීමේ අයදුම්පත්‍ර ගාස්තුව රු.50/- ක් හා සංශෝධනය කිරීමේ අයදුම්පත්‍ර රු.100/- කි.

III. මාර්ග බලපත්‍රය අවලංගු වන දිනයට පෙර සතියේ වැඩ කරන දින 07 කට කලින් බලපත්‍රය දීර්ඝ කර ගත යුතුය.

IV. එසේ නොමැතිව බලපත්‍රය අවලංගු වීමෙන් පසු මගී ප්‍රවාහනයේ යෙදෙන අවස්ථා වල දී ඒ සඳහා දඩ මුදල් ගෙවීමට සිදුවේ.

V. පහත සඳහන් ලියවිලි වල මුල් පිටපත් සහ ඡායා පිටපත බැගින්,

- ➢ ඉල්ලා සිටින කාලයට වලංගු වාහනයේ යෝග්‍යතා සහතිකය.
- ➢ සියළුම මගීන් සහ දේපළ සඳහා තෙවන පාර්ශව අසීමිත රක්ෂණය.
- ➢ වාහනයේ ලියාපදිංචි සහතිකය හෝ මෝටර්රථ කොමසාරිස්තැන විසින් නිකුත් කර ඇති වාහනයේ ලියාපදිංචි විස්තර පිළිබඳ සහතිකය.
- ➢ රියදුරු තැනගේ වෛද්‍ය සහතිකය.
- ➢ පසුගිය මාසය සඳහා ලබා ගත් ලොග් පත්‍රය හා ගාස්තු ගෙවා ඇති බවට රිසිට් පත.
- ➢ කොන්දොස්තර බලපත්‍රය.
- ➢ බස්රථ පරීක්ෂා කිරීම සඳහා රු.500/- ගෙවා ලබාගත් ලදුපත.
- ➢ අයිතිකරු විදේශගතව සිටින අවස්ථාවක.
  - අයිතිකරු විදේශ ගත වූ බවට ආගමන විගමන පාලක විසින් නිකුත් කළ තහවුරු කිරීමේ ලිපියක්.
  - අදාල රටෙහි තානාපති කාර්යාලය හරහා ලියාපදිංචි අයිතිකරු විසින් නව අයිතිකරු වෙත ලබාදුන් ගිවිසුම් පත්‍රය.
  - ඇටෝර්නි බලපත්‍රයක් ලබා දී ඇත්නම් එය ( ඉදිරිපත් වන දිනට වලංගු බවට ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ සහතික කළ)

VI. කෙටි කාලීනව ලබා දෙන තාවකාලික මාර්ග බලපත්‍ර, නැවත දීර්ග කරවා ගැනීමට ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් වීමේ දි අදාල ප්‍රදේශීය කාර්යාලයේ බස්රථ ධාවනය වීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය කළමණාකාර තුමා විසින් සහතික කරන ලද ධාවන වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

VII. මාසික ධාවන සටහන් පත්‍ර ගාස්තුව රු. 1000/- කි.

VIII. පෙර ගෙවුම් කාඩ්පත් භාවිතා කළ හැකි ප්‍රවේශ පත්‍ර නිකුතු යන්ත්‍රය.